## ඔපෙක් අරමුදලින් මූල්‍යයනය කරන බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - 2019

---

ඔපෙක් අරමුදලින් මූල්‍යයනය කරන බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රීලංකාවේ බස්නාහිර පළාතේ පෙර තෝරාගත් ජාතික මාර්ගවල කිලෝමීටර් 27 ක් වැඩිදියුණු කිරීම, සංවර්ධනය කිරීම හා පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණුවේ. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,232.5 කට සමාන එ.ජ.ඩො. මිලියන 24.87 ක් වන අතර ඉන් රු.මිලියන 2,209.84 කට සමාන එ.ජ.ඩො. මිලියන 17 ක් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල විසින් ලබාදීමට එකඟවී තිබුණි. ව්‍යාපෘතියේ එහි ඉදිකිරීම් කටයුතු 2017 ඔක්තෝබර් 05 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 28 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතියේ කටයුතු 2021 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 තත්ත්වාගණනය කල මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන ගැටළුව | මුදල | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | --------------- | --------<br>රු.මිලියන | -------- | -------------- | ------------ |
| (අ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුලදී ණය ගිණුමෙන් රු.මිලියන 643.56 ක් වියපැහැදැම් කර තිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල වියපැහැදැම් මුදල රු.මිලියන 440.18 ක් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ණය ගිණුම රු.මිලියන 203.38 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 203.38 | ණය ගිණුම රු.මිලියන 203.38 කින් අඩුවෙන් දැක්වේ. | රු.203,375,878.25 මුළු වියපැහැදැම් ශේෂය අතර වෙනස 2019 වර්ෂය සඳහා ලැබිය යුතු විදේශ ආධාර ලෙස ගිණුම්ගත කර ඇත. | 2019 දෙසැම්බර් 31 දිනට නිවැරදි මූල්‍ය තත්ත්වය දැක්වීමට ණය වියපැහැදම් වීම් නිවැරදිව වාර්තා කල යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් මාසය සඳහා සිදුකරන ලද වැඩ සම්බන්ධයෙන් අන්තර් ගෙවීම් සහතික අංක 15 සහ 23 යටතේ කරන ලද එකතුව රු.මිලියන 65.46 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වෙන් කිරීමක් සිදුකර නොමැත. | 65.46 | කෙරීගෙන යන වැඩ ගිණුම සහ කොන්ත්‍රාත්කරුව න්ට ගෙවිය යුතු ගිණුම අඩුවෙන් දැක්වේ. | යොමුගත අන්තර් ගෙවීම් සහතික කළමනාකරණ ඒකකය වෙත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසු ලැබී තිබුණි. එම නිසා ඉහත අන්තර් ගෙවීම් සහතික 2020 වර්ෂයේදී ගිණුම් ගත කර ඇත. | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ව්‍යාපෘතියේ නිවැරදි මූල්‍ය තත්ත්වය දැක්වීම අවශ්‍ය වේ. |
| (ඇ) | ව්‍යාපෘතිවල පිරිවැය සැලකීමකින් තොරව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පවතින අනෙකුත් ව්‍යාපෘති 6 අතර පොදු පිරිවැය වෙන්කිරීමට ව්‍යාපෘතිය වැරදි ක්‍රමයක් අනුගමනය කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 10.49 ව්‍යාපෘති දීමනා රු.මිලියන 1.65 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 1.65 | ව්‍යාපෘති පිරිවැය වැඩියෙන් දැක්වේ | සටහන් කර ගන්නා ලදි. වාර්තාවේ දැක්වෙන පරිදි 2020 වර්ෂයේදී නිවැරදි කිරීම් කරනු ලැබේ. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පවතින ව්‍යාපෘති අතර පොදු පිරිවැය වෙන්කිරීමට නිවැරදි ක්‍රමයක් අනුගමනය කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඉ) | 2019 ජුලි මාසය සඳහා උපදේශක දීමනා සම්බන්ධයෙන් රු.203,537 ක එකතු කිරීමේ අගය මත බදු මුදල අදාල ගිණුමේ වාර්තා කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල එම මුදලින් ව්‍යාපෘති පිරිවැය අඩුවෙන් දක්වා තිබුණි. | 0.203 | ව්‍යාපෘතියේ උපදේශක පිරිවැය අඩුවෙන් දැක්වේ. | සටහන් කර ගන්නා ලද අතර 2020 වර්ෂයේ අදාල ගිණුම්වල නිවැරදිව වාර්තා කරන ලදි. | වර්ෂය සඳහා වියදම් නිවැරදිව දැක්වීම සඳහා අදාල ලෙජර ගිණුම්වල ගණුදෙනු වාර්තා කිරීමට පියවර ගත යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික ප්‍රගතිය**

(අ) 2015 ජුනි 26 දින ණය ගිවිසුම අත්සන් කර තිබුණද ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත් පැකේජ් 1 යටතේ පුනරුත්ථාපන කටයුතු වර්ෂ 2 මාස 6 ප්‍රමාද වී ඇති අතර කොන්ත්‍රාත් පැකේජ් II යටතේ පුනරුත්ථාපන කටයුතු වර්ෂ 2 මාස 3 ක් ප්‍රමාද වී තිබුණි.

(ආ) මාර්ග වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත් පැකේජ් 1 යටතේ කඩුවෙල- අතුරුගිරිය මාර්ගයේ භෞතික ප්‍රගතිය අපේක්ෂිත භෞතික ප්‍රගතියට පිටුපසින් සියයට 52.93 ක් වූ අතර වල්ගම - අතුරුගිරිය මාර්ගයේ අපේක්ෂිත භෞතික ප්‍රගතියට පිටුපසින් සියයට 68.37 ක් විය. කොන්ත්‍රාත් පැකේජ් 2 යටතේ සියළුම මාර්ගවල මාර්ග වැඩි දියුණු කිරීමේ කටයුතුවල භෞතික ප්‍රගතිය අපේක්ෂිත භෞතික ප්‍රගතියට පිටුපසින් සියයට 90 ක්ව පැවතුණි.

**3.2 ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැටළුව**

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකයේ නිර්දේශය |
|---|---|---|---|
| ------------------------ | ------- | ---------- | ---------- |
| ව්‍යාපෘතිය විසින් රජයේ ඉඩම් කොටස් 416 ක් ඇතුළුව ඉඩම් කොටස් 2,611 ක් අත්පත් කරගෙන තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොටස් 218 ක් සඳහා වන්දි මුදල් රු.මිලියන 486.86 ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, පොළී ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් වෙන් නොකිරීම හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ කිසිදු ඉඩම් කොටසක් ලියාපදිංචි කර නොතිබුණි. | වන්දි පිරිවැය සහ ඒ මත පොලී ගෙවීම් පිරිවැය වැඩිවීමට ඉඩ ඇත. | එකඟ වේ. | ඉඩම් කොටස්වල අයිතිය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |